## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/142/2019 (NPC)

කේ.පී.චන්ද්‍රසෝම විජේරත්න පතිරණ
අභියාචක

එදිරිව

ජාතික පොලිස් කොමිෂන් සභාව
වගඋත්තරකරු

**දිනය :- 2025.04.29**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,

අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක එච්.ඩබ්.සෝමරත්න මහතා.

වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂක ආර්.එම්.එස්.පී.රත්නායක මහතා සමඟ නීති නිලධාරී ටී.කේ.ආර්.පී.ජයතුංග මෙනවිය.

### විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

දෙපාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරන ලදි. එකී සියළුම කරුණු වලට අවධානය යොමු කර පහත නියෝගය ප්‍රකාශයට පත්කරමු.

### -<u>නියෝගය</u>-

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2019.06.25 දිනැති අභියාචනයේ සඳහන් කර ඇත්තේ, ඔහුට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනාවන් සම්බන්ධයෙන් පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයේ දී වරදකරු වීම නිසා බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතමා විසින්, ඔහුගේ 2017.06.07 දිනැති ලිපිය මඟින්, අභියාචකට හිමිවිය යුතුව තිබූ වැටුප් වර්ධකයක් විලම්භනය කර, සේවයේ නොසිටි කාල පරිච්ජේදය සඳහා හිඟ වැටුප් හා වේතන කිසිවක් ලැබීමට හිමිකම් නොමැති බවටද දන්වා

ඇති බවයි. එකී නියෝගයට එරෙහිව ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති අභියාචනය සළකා බලා, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්, 2019.06.06 දිනැති ලිපිය මගින් ඉහත කී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ තීරණය ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යාමට තීරණය කරමින්, අභියචකගේ අභියාචනය නිශ්ප්‍රභ කර ඇත. ඒ අනුව අභියාචක ඉල්ලා ඇත්තේ ඔහුට අහිමි කර ඇති වැටුප් වර්ධකය ලබා ගැනීමට කටයුතු කරන ලෙසයි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් ඉදිරිපත් කර ඇති 2011.08.07 දිනැති චෝදනා පත්‍රය මගින් අභියාචක වෙත චෝදනා කර ඇත්තේ, රපානා රමේෂ් යන අය නිත්‍යානුකූල නොවන අන්දමින් සිරමැදිරියේ රඳවා තිබියදීත්, එවැනි අයෙකු සිර මැදිරියේ නොමැති බවට සඳහන් කරමින්, එදින රාජකාරියේ නියුතුව සිටි අභියාචක විසින් අසත්‍ය ප්‍රකාශයක් කර ඇති බවයි. ඒ අතරම ඉදිරිපත් කර ඇති ඉතිරි චෝදනාව වන්නේ, ඉහත කී රපානා රමේෂ් නැමැත්තා පොලිස් ස්ථානයේ සිර මැදිරියේ රඳවා සිටින බව දැන සිටිමින්, ඊට නිසි පියවරක් නොගැනීම හේතුවෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ ඒ 7 බී පරිශිෂ්ඨයේ සඳහන් විනය සංග්‍රහයේ 16 වගන්තිය යටතේ  දැක්වෙන වරදක් සිදුකර ඇති බවයි.

ඒ අනුව ඉහත චෝදනා දෙක ඔප්පු කිරීමට නම්, රපානා රමේෂ් නැමැති අය සිර මැදිරියේ රඳවා සිටි බවට සාක්ෂි ඉදිරිපත් වී තිබිය යුතුය. අභියාචක වෙනුවෙන් පෙනී සිටින එච්.ඩබ්.සෝමරත්න මහතා සඳහන් කරන්නේ, විධිමත් විනය පරීක්ෂණයේ සාක්ෂි දී ඇති එම්.රොෂානි නැමැති අය ඉහත කී රපානා රමේෂ් යන අයගේ සහෝදරියක බවත්, ඇය විනය පරීක්ෂණයේ දී සාක්ෂි දී ඇත්තේ ඇය විසින් රමේෂ් යන අය පොලිසියේ ඉන්නවාද කියා පොලිසියේ සෑම තැනම බැලූ බවත්, පොලිසියෙන් පිටතද බැලූබවත්, අයියා එම කිසිදු ස්ථානයක නොසිටි බවයි.

ඉහත කී රොෂානි යන අයගේ ප්‍රකාශයට විනිශ්චය සභාවේ අවධානය යොමු කරන ලදි. ඇය ඉහත සඳහන් ආකාරයට සාක්ෂි දී ඇති බව පැහැදිලිව පෙනී යයි. ඊට අමතරව ද පවසා ඇත්තේ "**පොලිසියේ තිබ්ච්ච කාමර, පිටිපස්සේ ළිඳ පැත්ත හැම තැනම පෙන්නුවා. කූඩුවෙත් බැලුවා. අයියා එක තැනකවත් සිටියේ නැහැ**" යනුවෙනි.

ඒ සමගම අංක 8 දරණ සාක්ෂිකරු වන රපානා රමේෂ් කුමාර යන අයද සාක්ෂි දෙමින් පවසා සිටියේ පොලිසියෙන් ඔහු අත් අඩංගුවට ගත් බවත්, ඒ අවස්ථාවේ දී පොලිස් කූඩුවට දැම්මාද කියා මතක නැති බවත්,

මල්ලී වන රොෂාන් බැලීමට රබර් වත්තට ගිය බවත්, රොෂාන් මල්ලී රබර් ගසක එල්ලී මියගොස් ඇති බව දැන ගන්නට නමුත් ඒ වෙලාවේ ප්‍රශ්නයක් ඇතිවේයැයි බියෙන් රබර් කැල්ලට ගොස් සැඟවී සිටි බවත් ය. තවද, පොලිසියෙන් අත් අඩංගුවට ගෙන සිටිය දී ශරීරික වශයෙන් තමන්ට හිංසා නොකළ බවත් ඔහු තවදුරටත් කරුණු දක්වා ඇත.

සාක්ෂිකරුවෙකු වන පොලිස් සැරයන් වික්‍රමසිංහ සඳහන් කරන්නේ විධිමත් විනය පරීක්ෂණයේ දී පො.සැ.විජේරත්නගේ ප්‍රකාශය ඔහු සටහන් කළ බවත්, එම ප්‍රකාශයේ, 2010.04.24 වන දින ජංගම සංචාරයේ යෙදී සිටි පොලිස් සැරයන් ලාල් යන අය රපානා රමේෂ් කුමාර යන අය එදින අත් අඩංගුවට ගෙන පොලිසියට ඉදිරිපත් කර ඇති බවක් එම ප්‍රකාශයේ සඳහන් කර නැති බවයි. මේ අවස්ථාවේ දි ජාතික පොලිස් කොමිෂම වෙනුවෙන් නීතිඥ ජයතුංග මෙනවිය දන්වා සිටින්නේ, රපානා රමේෂ් යන අය නිත්‍යානුල නොවන අන්දමින් සිර මැදිරියේ සිට ඇති බවට එවැනි සාක්ෂියක් සොයා ගැනීමට අසීරු බවයි.

මෙම තත්ත්වය යටතේ පැහැදලිව පෙනී යන්නේ, අභියාචක වෙත ඉදිරිපත් කර ඇති චෝදනාවන්හී ඔප්පු කළ යුතු කරුණක් වන රපානා රමේෂ් යන අය නිත්‍යානුකූල නොවන අන්දමින් සිර මැදිරියක් තුළ රඳවා තිබීම යන කරුණු ඔප්පු වී නැති බවයි.

ඒ අනුව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව නඟන ලද චෝදනාවන් ඔප්පු නොවුන අවස්ථාවකදී, අභියාචකට එරෙහිව විනය නියෝගයක් නිකුත් කිරීමට කටයුතු කරමින් ගෙන ඇති තීරණය දෝෂ සහගත වේ.

ඉහත කරුණු සළකා බලා, ජාතික පොලිස් කොමිෂම විසින් ගෙන ඇති, 2019.06.06 දිනැතිව අභියාචක වෙත යවන ලද ලිපියේ සඳහන් තීරණය, වැරදි සහගත බවට තීරණය කරමි. ඒ අනුව එම තීරණය ඉවත් කරන ලෙසට ජාතික පොලිස් කොමිෂම වෙත නියෝග කරමු.

මෙම නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පියවර ගන්නා ලෙසට ජාතික පොලිස් කොමිෂම වෙත තවදුරටත් නියෝග කරමු.

ඉහත කරුණු සළකා බලා ඉහත අභියාචනයට අවසර දෙමු.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2019.06.25 දිනැති අභියාචනයේ ඉල්ලා ඇත්තේ ඔහුට අහිමි වැටුප් වර්ධකය ලබා දෙන ලෙස පමණි. මෙම නියෝගය හේතුවෙන් ඔහුට හිඟ වැටුප් හා වෙනත් කිසිදු දීමනාවක් හිමිවන්නේ නැත.

එකී තීරණයන් ඒ අයුරින් ක්‍රියාත්මක කරන ලෙසට පොලිස් කොමිෂන් සභාව වෙත වැඩිදුරටත් නියෝග කරමි.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචකගේ ඉල්ලීමට අවසර දෙමු. අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-